# සිංහල සිනමාව හා ළමා චිත්‍රපට

ඉදිරිපත් කරනු ලබන්නේ

පී.ඩී.යූ.ඩී.ප්‍රනාන්දු

FGS/MACO/MC/08/006

ප්‍රවේශ අංකය: 1311
වර්ග අංකය:

සමාජීය විද්‍යාපති ජන සන්නිවේදනය උපාධියෙහි අවශ්‍යතාවක් පූරණය කරනු පිණිස කැලණිය විශ්ව විද්‍යාලයේ පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය වෙත ඉදිරිපත් කෙරෙන පර්යේෂණ නිබන්ධයකි.

අප්‍රේල් 2014

# සිංහල සිනමාව හා ළමා චිත්‍රපට

පී.ඩී.යූ.ඩී.ප්‍රනාන්දු

සමාජීය විද්‍යාපති ජන සන්නිවේදනය උපාධියෙහි අවශ්‍යතාවක් පූරණය කරනු පිණිස කැලණිය විශ්ව විද්‍යාලයේ පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය වෙත ඉදිරිපත් කෙරෙන පර්යේෂණ නිබන්ධයකි.

## සංක්ෂේපය


සිංහල සිනමාව හා ළමා චිත්‍රපට යන්න පෘථුල මාතෘකාවකි. මෙම පර්යේෂණ උත්සාහයේ මූලික අරමුණ එහි අංශු මාත්‍රයක් ලෙස හැඳින්විය හැකි, ළමා චිත්‍රපට අනුප්‍රවර්ගයක් ලෙස ප්‍රවර්ධනය නොවීමට බලපෑ හේතු සාධක පිළිබඳ අධ්‍යයනය කිරීම යි.

උක්ත අරමුණ සාධනයේ දී මූලික වශයෙන් ද්විතීක මූලාශ්‍ර යොදා ගත් අතර එමගින් ලබා ගත් තොරතුරු ප්‍රායෝගික ව තහවුරු කර ගැනීම සඳහා ප්‍රාථමික මූලාශ්‍ර ද අවස්ථානුකූල ව ඇසුරු කෙරුණි. ඒ අනුව චිත්‍රපට නැරඹීමත්, අදාළ නිර්මාණකරුවන්, බලධාරීන් හා ක්ෂේත්‍රයේ ප්‍රාමාණික විද්වතුන් සමඟ සජීවී ව හා අන්තර්ජාලය හරහා සම්මුඛ සාකච්ඡා ක්‍රමවේදය ක්‍රියාවට නැංවීමත් සිදු කෙරුණි. එමෙන් ම ළමා චිත්‍රපටයක තිබිය යුතු ගුණාංග කෙතෙක් දුරට සමන්විත වේ දැයි විමසා බැලීමට තෝරා ගත් චිත්‍රපට කීපයක් අන්තර් විශ්ලේෂණයට ද ලක් කෙරුණි. ඊට අමතර වශයෙන් සහභාගීත්ව නිරීක්ෂණය ද යොදා ගැනුණි.

උක්ත ක්‍රමවේද ඔස්සේ සාධිත පර්යේෂිත කරුණු සමෝධානය ආශ්‍රිත ව එළැඹි ප්‍රමුඛත ම නිගමනය වූයේ ළමා චිත්‍රපට අනුප්‍රවර්ගයක් ලෙස ප්‍රවර්ධනය කිරීමෙහි ලා අඛණ්ඩ ව ක්‍රියාත්මක ක්‍රමවත් වැඩපිළිවෙළක් මෙතෙක් නොමැති වූ බව යි. එනිසා ම දේශීය සිනමා ඉතිහාසය තුළ ළමා චිත්‍රපටයේ අවශ්‍යතාවය මතු වීම, ළමා චිත්‍රපට නිර්මාණයට සුදුසු පසුබිමක් ගොඩ නැගීම, බාධාකාරී සාධක ඉස්මතු වීම, ගොඩ නැගුනු පසුබිම බිඳ වැටීම, නැවතත් ළමා චිත්‍රපටයේ අවශ්‍යතාවය මතු වීම ආදී වශයෙන් චක්‍රීය සබඳතාවක් දක්නට ලැබේ. ගුණාත්මක ළමා සිනමාවක් බිහි කිරීමට නම් මෙම චක්‍රීය සබඳතාව බිඳලිය යුතු ය. ඒ සඳහා සුදුසු ම ක්‍රියා පිළිවෙත නම් ළමා චිත්‍රපට නිර්මාණය සඳහා ක්‍රමවත් වැඩපිළිවෙළක් අඛණ්ඩ ව ක්‍රියාවට නැංවීම යි. අපගේ යෝජනා මාලාව, මෙම චක්‍රීය සබඳතාව බිඳ දැමීම අරමුණු කොට ගත්තකි. ළමා චිත්‍රපට නිර්මාණය සඳහා වූ ක්‍රමවත් වැඩපිළිවෙළකින් හා එම වැඩපිළිවෙළ මෙන් ම කලින් කල ළමා චිත්‍රපට සම්බන්ධ ව ගනු ලබන තීන්දු තීරණ බලාත්මක කිරීම අරමුණු කොට ගත් ළමා චිත්‍රපට පිළිබඳ වූ රාජ්‍ය ප්‍රතිපත්තියක සැකැස්ම අන්තර්ගත යෝජනාත්මක අදහස් දැක්වීමකින් ද මෙම යෝජනා මාලාව සමන්විත වේ.


**මූල පද:-** ළමා චිත්‍රපට, අනුප්‍රවර්ගය, බාධාකාරී සාධක, ක්‍රමවත් වැඩපිළිවෙළ, රාජ්‍ය ප්‍රතිපත්තිය

# SINHALA CINEMA AND CHILDREN'S FILMS

P.D.U.D.Fernando

A thesis submitted to the Faculty of Graduate Studies, University of Kelaniya in partial fulfillment of the requirements for the degree of Master of Social Sciences in Mass communication

## Abstract

Sinhala Cinema and Children's Films is an extensive topic and children's films can be considered as a speck of it. The main objective of this research attempt is to study the facts that affected the children's films preventing it from progressing as a subcategory of the Sinhala Cinema.

To fulfill the above objective, the secondary sources were mainly used whilst associating primary sources as and when required. Accordingly, viewing films, and methods of live and online interviewing of producers, authorities and scholars concerned were carried out. As such, a few selected films were intra-analyzed to find out their quality as children's films. In addition to this, the participant observation was also applied.

The main conclusion reached through the above methodologies and collocation of researched and processed facts is lacking a continuously applied and systematic program in order to promote the children's films as a subcategory of Sinhala cinema. As a result, there could be seen some cyclical events such as rising demand for the children's films in the history of Sinhala cinema, creating a background suitable for children's films, emergent obstructing facts, collapse of the background built, and re-emerge of requirement of children's films, etc. For the purpose of building a high quality children cinema, these cyclical events have to be discontinued and the best action to be taken is using a continuously running, systematic program. Aim of our proposals is to prevent the above cyclical events from occurrence. This study also proposes the idea and sketch for a state policy on the systematic program for the children's films, and enforcement of decisions taken on children's cinema.

**Key words:** Children's films, subcategory, obstructing facts, systematic program, state policy